

### ව්‍යවස්ථාව කුමක්දැයි නොදන්නා අයත් පාර්ලිමේන්තුවේ හිටියා

# මහජන මුදල් කළමනාකරණය කළ හැකි බුද්ධිමත් පිරිසක් මැති සබයට යැවිය යුතුයි

## පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

**ජේ.ටී. ද සිල්වා**

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේදී, පාර්ලිමේන්තු කාර්යභාරය සිදු කිරීමට හැකි, නීති සම්පාදනයට, ප්‍රතිපත්ති සම්පාදනයට මෙන්ම මහජන මුදල් කළමනාකණය කිරීමට හැකි බුද්ධිමත් පිරිසක් පාර්ලිමේන්තුවට තෝරාපත් කර යැවීමේ ප්‍රබල අවශ්‍යතාවක් පවතින බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි අවධාරණය කරයි.

අප රටේ ප්‍රධාන ලියවිල්ල වන ව්‍යවස්ථාව කුමක්දැයි නොදන්නා අය පවා 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී පාර්ලිමේන්තුවට තෝරා පත්කළ බවද හෙට්ටිආරච්චි මහතා සිහිපත් කරයි.

පාර්ලිමේන්තුවට නියෝජිතයන් තෝරා පත් කරන්නේ වසර පහකට වුවද, සුදුසු පිරිසක් තෝරා පත් කිරීමට අප අපොහොසත් වුවහොත් ඔවුන් ගනු ලබන වැරැදි තීරණ මත රටේ ඉදිරි දශක ගණනාවක පැවැත්ම අභියෝගයන්ට ලක්වීම නොවැළැක්විය හැකි බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි.

මෙවර මැතිවරණයේදී සමාජ මාධ්‍ය ජාල ඔස්සේ බරපතළ ලෙස මැතිවරණ නීති උල්ලංඝනය කරමින් කටයුතු කළ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කළ බව පෙන්වා දෙන හෙට්ටිආරච්චි මහතා සමාජ මාධ්‍යවලට නිකුත් කළ එවැනි සිද්ධීන් 3444ක් තම සංවිධානය වෙත වාර්තා වී ඇතැයිද සඳහන් කරයි.

තමන්ට මැතිවරණ නීති උල්ලංඝනය කළ අය 961 දෙනකු පිළිබඳ වාර්තා වී ඇති බව සඳහන් කරන පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂවරයා, වෙනත් මැතිවරණවලදී පැවැති තත්ත්වයට වඩා මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේදී සතුටුදායක තත්ත්වයක් පැවැති බවද පෙන්වා දෙයි.

පෙරේදා රාත්‍රී 12 සිට නිහඬ කාලය ආරම්භ වූ නමුත්, එම කාලය තුළ සෘජු හෝ වක්‍ර ක්‍රමවලින් භෝජන සංග්‍රහ, ආගමික උත්සව, සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කර ඇතැයිද එවැනි සිද්ධීන් 944ක් පිළිබඳ වාර්තා වී ඇති අතර ඉන් සිද්ධීන් 140ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇතැයි පැෆරල් මූලස්ථානයේදී ඊයේ (03දා) පැවැති මාධ්‍ය හමුවකදී රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

ගිරිඋල්ල, දික්වැල්ල, මාතර, කෑගල්ල යන ප්‍රදේශවල එවැනි සිද්ධීන් සිදුවී ඇතැයිද කෑගල්ල ප්‍රදේශයේ නිහඬ කාලය තුළ රථ පෙළපාළියක්ද ගොස් ඇති බවට තොරතුරු වාර්තා වී ඇතැයි හෙතෙම පැවැසීය.

තැපැල් ඡන්ද මධ්‍යස්ථානවල සියයට 98ක්ම සෞඛ්‍ය ආරක්ෂිත වැඩපිළිවෙළ ක්‍රියාත්මක වූ බවත්, මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දය විමසන ඡන්ද මධ්‍යස්ථාන 12,984ම සෞඛ්‍ය උපදෙස්වලට අනුව ඡන්ද විමසීම සිදු කෙරෙන බවත් සඳහන් කළ රෝහණ හෙට්ටිආරච්චි මහතා, සියයට සියයක්ම සෞඛ්‍ය ආරක්ෂිතව ඡන්ද විමසීම සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව අවශ්‍ය සියලු පියවර ගෙන ඇති බැවින් නොබියව ඡන්ද මධ්‍යස්ථානයට පැමිණ තම ඡන්දය පාවිච්චි කරන ලෙස ඉල්ලීමක් කරයි.

මෑත ඉතිහාසයේ පාර්ලිමේන්තු මැතිවරණයක් සඳහා පැවැති දීර්ඝ තම ප්‍රචාරක සමය, පෙරේදා (2දා) මධ්‍යම රාත්‍රියෙන් අවසන් වූ අතර, මෙවර මැතිවරණයේ ප්‍රචාරක කටයුතු වෙනත් පාර්ලිමේන්තු මැතිවරණවලට වඩා දෙයාකාරයකින්ම පාලනය කරන ලද තත්ත්වයක් යටතේ සිදු කිරීමට අපේක්ෂකයන්ට සිදුවූ බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසයි.